# සහෝදර ඒකාබද්ධතාවය

ජාතික හා ආගමික සහජීවනයේ කේන්ද්‍රස්ථානයක් වන කෑගලු දිස්ත්‍රික්කයේ සිංහල ,දමිළ ,මුස්ලිම් සහ අවශේෂී සුළු ජාතීහුද මිත්‍රශීලීව ජීවත් වෙති. වර්ෂ 2011 ජන සංගණනයට අනුව දිස්ත්‍රික්කය තුළ සමස්ත ජනගහනය 839493 කි.

භාෂාත්මක ලෙස සුවිශේෂී අනන්‍යතාවක් කෑගලු පුරවැසියනට ඇති බවද කිව මනාය. ලක්දිව හතර කෝරළය ර්ටම සුවිශේෂී භාෂා කලාපයක් වන අතර කෑගල්ල කේන්ද්‍ර කොටගෙන විහිදී පවත්නා වෙසෙස් වාග් මාලාවකටද උරුමකම් කියයි.

කෑගලු පුරය බහුවිධ ජාතීන්ගේ වාසභූමියක් නිසා ඔවුන් අදහන ආගම් හා දර්ශනයන්ද බොහෝය. බහුතරය සිංහල වන නිසාම ජන සංයුතියෙන් 84.71% ක් පිරිස බෞද්ධාගමිකයෝ වෙති. මෙයට අමතරව හිංදු ,ඉස්ලාම් ,ක්‍රිස්තියනි ,රෝමානු කතෝලික හා වෙනත් ආගම් භක්තිකයෝද ආගමික සහජීවනයෙන් දිවි ගෙවති. බෞද්ධාගමික වශයෙන් සුපතල ලක්දිව අවසන් රහතන් වහන්සේ වන මලියදේව හිමි වැඩ විසූ වට්ටාරම රජමහා විහාරය ,උඩව පුරාණ විහාරය ,දැදිගම රජමහා විහාරය ,යටහලෙන පුරාණ රජමහා විහාරය ,දනගිරිගල රජමහා විහාරය ,දැලිවල කොටවෙහෙර ආදී පෞරාණික විහාරස්ථාන සේම අලුත් නුවර ශ්‍රී දැඩිමුණ්ඩ දෙවොලද ඓතිහාසික සීතාවක බැරැන්ඩි කෝවිල ද කෑගලු දිශාවට අයත් වූ ලක්වැසි බැතිමතුන්ගේ වන්දනයට පාත්‍ර වූ සිද්ධස්ථානයන්ය. බුදු සසුනෙහි මතු චිරස්ථිතිය උදෙසා ඇප කැප වී කටයුතු කළ වැලිවිට සංඝරාජ හිමි ප්‍රමුඛ ශිෂ්‍යානුශිෂ්‍ය යතිවරයාණන් වහන්සේලා වැඩ සිටි පුන්‍ය භූමිය වූයේද කෑගලු දිසාවයි.



